**කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 23 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවේ ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.27,205,393 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ii) | ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම අතර, රු.350,567 ක වෙනසක් විය. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |
| (iii) | පල්ලේකැලේ ජනසවිගම නිවාස ව්‍යාපෘතියට අදාළව කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවට පවරා දී තිබුණු ඉඩම් හෙක්ටයාර 1.044 ක හා මැනුම් නොකල ඉඩම් 13 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |
| (iv) | ඉකුත් වර්ෂවල ඉඩම් වෙන්දේසි කිරීමෙන් ලැබී තිබුණු රු.2,033,912 ක ආදායමක් ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |
| (v) | සභාව සතුව පැවති මෝටර් රථ 2 ක් හා ඉකුත් වර්ෂයකදී පරිත්‍යාගයක් ලෙස ලැබූ ට්‍රේලරයක වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | අවසන් තොගය තුළ භෞතිකව නොතිබුණු රු.4,837,105 ක ජල කර්මාන්ත භාණ්ඩ තොගයක් ඇතුළත් කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ හා මුද්දර ගාස්තු උපචිත පදනමට ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කසළ බදු ආදායම් රු.1,347,070 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | පිළිගනිමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 22 දෙනෙක් නඩු පවරා තිබුණු අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගන්නා බව දන්වමි. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.298,176,483 ක් වූ ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.137,170,814 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සොයා බලා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | මෙම ශේෂ නිරවුල් කිරීමට 5 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර ඇති බව දන්වමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ අයිතම 3 ක එකතු වටිනාකම රු.56,423,330 ක් විය. එයින් වසර 1 සිට 5 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.10,855,650 ක් වූ අතර, වසර 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.15,285,156 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ අයිතම 3 ක එකතු වටිනාකම රු.7,208,594 ක් විය. එයින් වසර 1 සිට 3 දක්වා කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.6,253,022 ක් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ගෙවිය යුතු ශේෂ තහවුරු කර ගැනීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.24,338,396 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව තොග ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, උපලේඛන හා අගරු චෙක්පත් වලට අදාළ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුව පිළිගන්නා බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | |
| | (i) 149 වගන්තිය | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටලයකින් 2017 අප්‍රේල් 1 සිට 2018 මාර්තු 31 දක්වා කාලයට සියයට 1 දක්වා ගාස්තුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කරන ගිණුම් වාර්තා කට්ටලය ලබා ගෙන ආදායම අය කළ යුතු වේ. | නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. |
| | (ii) 126 (vii) (ඊ) වගන්තිය හා 2016 දෙසැම්බර් 13 දින ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍රය | වර්ෂය ආරම්භයේ දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, සියළුම දැන්වීම් සඳහා ගාස්තු අයකර නොතිබුණි. | වර්ෂය ආරම්භයේ සමීක්ෂණය කර ආදායම ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නොගෙවූ දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ගාස්තු ගෙවීම් කිරීමට දැනුම් දී ඇති බව දන්වමි. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1898 අංක 09 දරන ගෝඝාතකයන් හා ගෝඝාතක ස්ථාන පිළිබඳ පනතේ 8 වගන්තිය | ගෝඝාතක ස්ථානයක් සඳහා ගැසට් කර විරෝධතා කැඳවිය යුතු වුවත්, ඊට පටහැනිව සභාපතිවරයාගේ අත්සනින් තාවකාලික බලපත්‍ර ලබාදීමට කටයුතු කර තිබූ අතර, නීති, රීති ප්‍රකාරව මෙම වෙළඳ ස්ථානය සකස් කර නොතිබුණි. | බලපත්‍ර ලබා දීමේදී නීති, රීති අනුව කටයුතු කළ යුතු වේ. | ලබාදුන් බලපත්‍රය 2020 ජනවාරි 28 දින තාවකාලිකව අත්හිටුවන ලද බව දන්වමි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| (i) 2013 ජුලි 31 දිනැති අංක 07 චක්‍රලේඛය | බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නැවතුම්පලවල් 127 ක ත්‍රීරෝද රථ 1263 ක් ලියාපදිංචි කර තිබුණද, ක්‍රමවත්ව ගාස්තු අය කර නොතිබීම නිසා රු.276,396 ක හිඟයක් විය. | ත්‍රීරෝද රථ විධිමත්ව සමීක්ෂණය කර ගාස්තු ක්‍රමවත්ව අය කළ යුතු වේ. | 2019 මාර්තු 31 දිනට සමීක්ෂණය අවසන් කර ඇත. ධාවනයේ නොමැති ත්‍රීරෝද රථ බිල් කිරීම අත්හිටුවා ඇති බව දන්වමි. |
| (ii) 2018 අප්‍රේල් 24 දිනැති අංක 2018/04 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව කැබ්රථයක් රු.314,364 ක මුදලකට අළුත්වැඩියා කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | ප්‍රමාද දෝෂයකින් අනුමැතිය ලබා ගැනීමට නොහැකි වී ඇති බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,898,648 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.46,517,379 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල් කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,006,682 | 29,092,209 | 21,020,016 | 2,887,295 | 9,938,681 | 9,981,743 | 7,094,801 | 7,511,399 |
| (ii) | කුලී | 8,400,000 | 8,552,745 | 8,026,451 | 901,002 | 6,863,272 | 10,418,822 | 8,449,819 | 17,258,864 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,301,000 | 5,416,000 | 4,551,048 | 864,951 | 2,332,000 | - | 5,816,917 | - |
| (iv) | වෙනත් ආදායම් | 745,000 | 624,000 | 345,210 | 440,006 | 6,218,200 | 789,600 | 16,957,085 | 2,400,518 |
| | | 19,452,682 | 43,684,954 | 33,942,725 | 5,093,254 | 25,352,153 | 21,190,165 | 38,318,622 | 27,170,781 |

## 2.2.2 කුලී

**කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මැණික්හින්න වෙළඳ සංකීර්ණවල කඩ කාමර 50 කින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.887,750 ක් කඩ කුලී හිඟව පැවතුණි. | හිඟ කඩකුලී අයකර ගත යුතු වේ. | හිඟ මුදල් නොගෙවන්නේ නම් මුද්‍රා තැබීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.2.3 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී බලපත්‍ර ආදායම රු.1,265,869 ක් අඩුවී තිබුණි. වෙළඳ ස්ථාන පිළිබඳව විධිමත්ව සමීක්ෂණයක් සිදුකර නොතිබීමෙන් ආදායම අඩු වී තිබුණි. | විධිමත් සමීක්ෂණයක් සිදුකර ගාස්තු අය කළ යුතු වේ. | විධිමත් සමීක්ෂණයක් කර බලපත්‍ර ගාස්තු ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සමඟ ගිවිසුම්ගත වූ ආයතනයකට පොහොර අළෙවි කිරීමෙන් රු.1,062,380 ක මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම කරුණු සමථ මණ්ඩලයට යොමුකර අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ හා මුද්දර ගාස්තු බිල් කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට හිඟයක් හඳුනාගත නොහැකි විය. | මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය වෙමින් පවතින බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 19 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයා ගැනීමට හැකි අවස්ථා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව දන්වමි.. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2016 වර්ෂයේදී රු.9,080,564 ක් වැයකර ඉදිකළ පල්ලේකැලේ රජරුපපොළ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 5 ක් නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) | ජාතික විදුලිබල මණ්ඩලයෙන් සපයා ඇති තෙකලා සැපයුමේ විදුලිය සමතුලිත නොවීම මත සමාලෝචිත වර්ෂයේදී රු.4,536,144 ක් වැයකර ස්ථාපිත කළ විදුලි සෝපානය අක්‍රීයව පැවතුණි. | විදුලි සෝපානය ක්‍රියාකාරී තත්ත්වයට පත්කළ යුතුවේ. | විදුලි පද්ධතියේ ධාරිතාව ප්‍රමාණවත් නොවන නිසා විදුලි රැහැන් ඇදීමකින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාව සතු දිගන පොදු වැසිකිළිය 2017 වර්ෂයේ රු.2,000,000 ක වියදමක් දරා අළුත්වැඩියා කර ඇතත්, ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | වැසිකිළි අළුත්වැඩියා කර මහජන සුබසාධනය ඇති කළ යුතු වේ. | පල්දෝරු පද්ධතිය සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iv) | සිරිමල්වත්ත නිවාස යෝජනා ක්‍රමයේ ඉඩම් කට්ටි අංක 9 මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේදී රු.1,230,910 ක් ගෙවා ඇතත්, ගෙවිය යුතු ඉතිරි මුදල් ගෙවා ඉඩම පවරා ගැනීමට හෝ ගෙවූ මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම මිලට ගැනීමට හෝ ගෙවූ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

(ඈ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් රු.3,475,000 ක් වටිනාකම වූ කර්තව්‍යයන් 21 ක් ඉටු කිරීමේ ප්‍රමාදයක් පැවතුණි. | සියළු ව්‍යාපෘති කාලීනව නිම කළ යුතු වේ. | පිළිගනිමි. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කුණ්ඩසාලේ හා පාතදුම්බර ප්‍රාදේශීය සභා ඒකාබද්ධව දිරන කසළවලින් ස්වයංක්‍රීය ස්වායු තාක්ෂණික කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනිමට නොහැකිවී තිබුණි. නොදිරන කසළ ප්‍රතිචක්‍රීයකරණයට යොමු නොකර පරිසරයට හානිවන අයුරින් හුණුගල් වළවල්වලට දමා පස් දමා වැසීම සිදුකර තිබුණි. | කාබනික පොහොර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම හා විධිමත්ව නොදිරන කසළ කළමනාකරණය කළ යුතු වේ. | පිළිගනිමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර නොමැත. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගත යුතු වේ. | පිළිගනිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රජරුපපොළේ ආරම්භ කර තිබූ හෙළ බොජුන් හලෙන් කිසිදු කුලී මුදලක් අයකර නොතිබුණි. | සභාවට ලැබිය යුතු ආදායම් ලබා ගත යුතු වේ. | මෙම කොටස්ලාභීන් වෙත ගිවිසුම්ගතවීමට පැමිණෙන ලෙස දැනුම් දුන්නද පැමිණ නැති බව දන්වමි. |
| (ආ) | බලගොල්ල මොරගහපිටිය බහුකාර්ය ගොඩනැගිල්ලේ හා දිගන බහුකාර්යය ගොඩනැගිල්ලේ කඩ කාමරවල තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම නිසා රු.19,080,000 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, නව තක්සේරුවක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම මත කඩ කුලී අය කිරීම හා නව තක්සේරුවක් ක්‍රියාත්මක කළ යුතු වේ. | නව තක්සේරුව ලබාගෙන බදුකරුවන් තෝරා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවේ තනතුරු 8 ක් සේවක පුරප්පාඩු 10 ක් හා තනතුරු 1 ක සේවක අතිරික්තතා 1 ක් විය. | තනතුරු පුරප්පාඩු පිරවීම හා අතිරික්තතා ඇති නොවන ලෙස කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු.927,087 ක ආපදා ණය ශේෂයක් අයවීමට තිබුණි. | ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු දිගන හා මැණික්හින්න නගරයේ ඇති වැසිකිළි 2 ක් ටෙන්ඩර් කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැසිකිළි ටෙන්ඩර් කර සේවා සපයා සභාවට ආදායමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජල නල පද්ධතිය යථා තත්ත්වයට පත්කර ටෙන්ඩර් කර ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.5,369,900 ක් වටිනා වාහන 05 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | ප්‍රයෝජනයට ගතහැකි වත්කම් අලුත්වැඩියා කිරීමට හා නිෂ්ක්‍රීය වත්කම් අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම වාහන සම්බන්ධ ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ආයුර්වේද වෛද්‍යවරයාට 2018 වර්ෂය තුළ රු.728,256 ක් හා 2019 වර්ෂයේදී රු.770,472 ක් ලෙස වැටුප් ගෙවීම සිදු කළද, ඔහු කිසිදු රාජකාරියක නිරත නොවීම හේතුවෙන් එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | මෙම වෛද්‍යවරයා වෙනත් සභාවකට හෝ අනුයුක්ත කර සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම වෛද්‍යවරයා සේවයට වාර්තා කිරීමට පල්ලේගුන්නෑපාන ජංගම මධ්‍යස්ථානය විවෘත කළ බව දන්වමි. |

### 3.6 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| CCTV කැමරා පද්ධතියක් සවි කිරීම සඳහා ආයතනයේ අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව පිළිවිතර සකස් කර මිල ගණන් කැඳවීමේ පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රු.48,606 ක මුදල වැය කර ඇතත්, අදාළ කාර්යය ඉටුකර නොතිබීමෙන් සභාවට පාඩුවක් සිදුවී තිබුණි. | පිරිවිතර සකසා ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතු වේ. | කැඳවූ ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව සලකා නොබැලූ බැවින් මෙම තාක්ෂණ කමිටුවෙන් පිරිවිතර සකසා අදාළ කාර්යය ඉටුකර ගැනීමට යොමුකර ඇතත්, පිරිවිතර නොලැබීම මත ලංසු කැඳවීමට නොහැකි වූ බව දන්වමි. |

**3.7 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේදී ප්‍රජා මූල සංවිධානවල ධාරිතා සංවර්ධනය ව්‍යාපෘතිය යටතේ ලුණුකැටියාමඩිත්ත බහුකාර්ය ගොඩනැගිල්ල සංවර්ධනයට රු.1,300,000 ක මුදලක් වැයකර ඇතත්, මෙම ඉදිකිරීම සඳහා සැලසුම් අනුමත කර නොතිබුණු අතර, ගොඩනැගිල්ලෙහි පසු පස කොටස ඇල මාර්ගයේ ඉදිකර තිබූ බැවින් වර්ෂාවේදී ගොඩනැගිල්ලෙහි අත්තිවාරම පැදී තිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීමේදී සැලසුම් අනුමත කර ඉදිකිරීම් සිදු කළ යුතු වේ. | මෙම ගොඩනැගිල්ලේ අයිතිය ප්‍රාදේශීය ලේකම් සතුවන අතර, ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර සැලසුම් අනුමත කරගෙන නොතිබුණ බැවින් අත්තිවාරමේ අඩුපාඩු ආරම්භක ඉදිකිරීම් සිදුවන අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නිවැරදි විය යුතු බව දන්වා ඇත. පළාත් සභාවෙන් ප්‍රතිපාදන වෙන්කර දුන් අතර, ඉදිකිරීම් පමණක් මෙම කාර්යාලයෙන් කළ බව දන්වමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත් කර ඇතත් ප්‍රමාණවත් විගණනයක් සිදුකර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | සේවක පුරප්පාඩු පිරවූ පසු අභ්‍යන්තර විගණනය ක්‍රමවත් කරන බව දන්වමි. |